**බස්නාහිර පළාත් සභාව - 2014**

---------------------------------------

බස්නාහිර පළාත් සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මෙහි ඇතුලත් විගණන නිරීක්ෂණ පිළිබඳ විස්තරාත්මක වාර්තාව පළාත් සභාවේ සභාගත කිරීම සඳහා යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරා ගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, පළාත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

--------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කිරීම.**

---------------------------------------------

**(අ) පළාත් සභා අරමුදල් ගිණුම**

------------------------------

සමාලෝචිත වර්ෂයේ පළාත් සභා අරමුදල් ගිණුම 2015 මාර්තු 24 දින විගණනයට ඉදිරිපත් කරන ලදි.

**(ආ) අනෙකුත් ගිණුම්**

------------------

2015 ජුනි 30 දිනට පළාත් සභාවේ අනෙකුත් ගිණුම් ඉදිරිපත් කිරීමේ තත්ත්වය පහත දැක්වේ.

| | | 2014 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|---|
| | | **මුළු ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් කළ ගිණුම් සංඛ්‍යාව** | **ඉදිරිපත් නොකළ ගිණුම් සංඛ්‍යාව** |
| (i). | විසර්ජන ගිණුම් | 27 | 27 | - |
| (ii). | ආදායම් ගිණුම් | 30 | 30 | - |
| (iii). | පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් | 35 | 35 | - |
| (iv). | වාණිජ අත්තිකාරම් ගිණුම් | 02 | 02 | - |
| (v). | වෙනත් අත්තිකාරම් ගිණුම් | 06 | 06 | - |
| (vi). | අරමුදල් ගිණුම් | 06 | 06 | - |
| (vii). | ප්‍රඥප්ති ගිණුම් | 09 | 05 | 04 |

2.2.2 ප්‍රතිපාදන කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 11 ක වැය විෂයයන් 17 ක් යටතේ වූ රු. 15,155,843 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ශීර්ෂ 16 ක වැය විෂයයන් 93 ක් යටතේ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට බැඳීම රු. 94,216,968 ක් විය.

(ඇ) එක් ශීර්ෂයක එක් වැය විෂයකින් ප්‍රතිපාදන ඉතිරිවී ඇති බව දක්වා වෙනත් වැය විෂයකට ප්‍රතිපාදන මාරුකර තිබූ නමුත් පසුව එම විෂයට අතිරේක ප්‍රතිපාදන ලබාගත් අවස්ථාවක් නිරීක්ෂණය විය.

2.2.3 අග්‍රිම ගිණුම්

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිරවුල් නොකළ අග්‍රිම ශේෂ එකතුව රු.654,980,048 ක්වූ අතර, එය එකතුව රු.2,112,613,501 ක්වූ හර ශේෂයකින් හා එකතුව රු.1,457,633,453 ක්වූ බැර ශේෂයකින් සමන්විත විය. ඒ අනුව ආයතන 05 කට අදාලව ලබාදී තිබූ අග්‍රිම සීමාවන් ඉක්මවා රු.1,457,633,453 ක පියවීම් සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

2.2.4 ප්‍රේෂණ ගිණුම්

පළාත් භාණ්ඩාගාර පොත් අනුව සමාලෝචිත වර්ෂය අවසාන වනවිට නිරවුල් නොකළ ප්‍රේෂණ ශේෂ එකතුව රු. 310,982,294 ක්වූ අතර, එය එකතුව රු. 1,466,570,793 ක්වූ හර ශේෂයකින් හා එකතුව රු. 1,155,588,499 ක්වූ බැර ශේෂයකින් සමන්විත විය.

2.2.5 පොදු තැන්පත්

2014 දෙසැම්බර් 31 දිනට පළාත් භාණ්ඩාගාර පොදු තැන්පත් ගිණුමේ රු. 469,269,990 ක ශේෂයක් වූ අතර, ආයතන 14 ක මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාර කටයුතු නොකළ අවුරුදු 02 ඉක්මවා තිබූ තැන්පත් ශේෂ වල එකතුව රු. 13,493,790 ක් විය.

2.2.6 පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම්

අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 18 ක දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින පළාත් සභා නිලධාරී අත්තිකාරම් ශේෂ එකතුව රු. 198,956,843 ක්වූ අතර, එයින් රු. 78,590,977 ක් අවුරුදු 01 සිට 04 දක්වා කාලයකටද රු. 120,365,866 ක් අවුරුදු 04 සිට 10 දක්වා කාලයකටද අදාල විය.

**2.2.7 නොසැසඳූ පාලන ගිණුම්**

ඒ ඒ දෙපාර්තමේන්තු වලින් ඉදිරිපත් කරන ලද ගිණුම් හා පළාත් සභා අරමුදල් ගිණුම (පළාත් භාණ්ඩාගාර පොත්) අතර පහත දැක්වෙන වෙනස්කම් නිරීක්ෂණය විය.

| ගිණුම් විස්තරය | ඒ ඒ දෙපාර්තමේන්තු වල ගිණුම් අනුව ශේෂය | පළාත් සභා අරමුදල් ගිණුම අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| අග්‍රිම ගිණුම් 14 ක් | 4,895,816,695 | 4,840,550,707 | 55,265,988 |
| පොදු තැන්පත් ගිණුම් 04 ක් | 32,876,597 | 26,496,747 | 6,379,850 |
| පළාත් සභා නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් 06 ක් | 928,501,222 | 957,475,444 | 28,974,222 |
| ප්‍රේෂණ ගිණුම් 08 ක් | 103,488,511 | 107,636,727 | 4,148,216 |
| ආදායම් ගිණුම් 02 ක් | 162,103,146 | 138,971,114 | 23,132,032 |

**2.2.8 ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම**

පළාත් සභාව විසින් ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් දක්වා නොතිබූ අතර එවැනි වත්කම් ඇති බවට මූල්‍ය ප්‍රකාශන සටහන්වලින්ද හෙළිදරව් කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම්වල වූ ජංගම නොවන වත්කම් සංචලන වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු. 1,701,296,058 ක පහත සඳහන් ස්ථාවර වත්කම් පළාත් සභාව සතුව තිබුණු බව තහවුරු කර තිබුණි.

| විස්තරය හා වැය සංකේත | වටිනාකම |
|---|---|
| | රු. |
| වාහන - 2101 | 526,293,770 |
| ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ - 2102 | 396,079,234 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - 2103,2002 | 470,313,469 |
| ගොඩනැගිලි හා ඉදිකිරීම් - 2104,2107,2001,2005 | 260,816,892 |
| ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් - 2105 | 14,680,438 |
| වෙනත් - 2106,2004 | 33,112,255 |
| | 1,701,296,058 |

**2.2.9 ගිණුම්වලින් අත්හැරීම්**

පෞද්ගලික බස්රථ පනත යටතේ අයකරන ගාස්තු ආදායම් රු.33,912,249 ක් වුවත් එය අරමුදල් ගිණුමේ රු.10,775,828 ක් ලෙස දක්වා තිබීම නිසා රු.23,136,421 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

**2.2.10 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 කට අයත් ඉඩම් බදුකරුවන් 324 කගෙන් වසර 10 ඉක්මවා ලැබිය යුතු බදු මුදල රු. 2,609,528 ක් වී තිබුණි.

(ආ) හොරණ කලාප අධ්‍යාපන කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට කල්ඉකුත් වූ රු.1,159,627 ක තැන්පතු පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර 2009 වර්ෂයේ රු.25,000 ක්වූ ශිෂ්‍යාධාර මුදල් අදාල සිසුන්ට නොගෙවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) මතුගම කලාප අධ්‍යාපන කාර්යාලයේ 2011 වර්ෂයේ සිට පැවත එන රු. 206,741 ක්වූ අතරුඳවුම් හා ටෙන්ඩර් තැන්පතු නිදහස් කිරීමෙන් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**2.2.11 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**පිළිතුරු නොලත් විගණන විමසුම්**

පළාත් සභාවේ විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කළ විගණන විමසුම් 11 කට 2015 ජුනි 30 දිනටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.12 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2011, 2012 හා 2013 වර්ෂවලට අදාල උපයන විට ගෙවීමේ බදු ගණනය කිරීමේදී බද්දට යටත් ප්‍රසම්පාදන, ව්‍යාපෘති වැනි ඇතැම් දීමනා ඇතුළත් නොකර බද්ද ගණනය කිරීම නිසා රු.554,209 ක් අඩුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. |
| (ආ) | 2008 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ප්‍රඥප්තියේ 05 වගන්තිය | ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීමෙන් පසු වර්ෂ 03 ක් ඉක්ම ගිය විට නැවත සමාලෝචනයකින් පසුව ලියාපදිංචිය අලුත් කළ යුතු වුවත් ළමා නිවාස 40 ක ලියාපදිංචිය අළුත් කළ යුතු දිනය අවසන්ව වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද ඒවායේ ලියාපදිංචිය අළුත්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 571 | ගෙවල් කුලී පනත යටතේ 1991 සිට 2011 දක්වා තැන්පත්කරුවන් 106 ක් විසින් තැන්පත් කරන ලද |

| | | |
|---|---|---|
| | | රු. 4,230,834 කින් නඩු කටයුතු අවසන් වූ තැන්පත් සොයාබලා ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 09 සහ 10 වගන්ති | මසකට එක් දිනකට වැඩියෙන් නිවාඩු දින රාජකාරි දීමනා ලබාගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියක් රහිතව 2012, 2013, 2014 වර්ෂවල පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් 47 දෙනෙකු සඳහා නිවාඩු දින වැටුප් වශයෙන් රු.3,683,920 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය | නිල වාහන අනුයුක්ත කර තිබූ උසස් නිලධාරීන් සංචිත වාහන භාවිතා කර තිබූ අවස්ථා තිබුණි. |
| (ඊ) | 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ දුරකථන දීමනා සඳහා හිමිකම් නොලබන නිලධාරීන් 39 දෙනෙකු වෙනුවෙන් විධිමත් අනුමැතිය නොලබා 2012 සහ 2013 වර්ෂ වෙනුවෙන් දුරකථන දීමනා රු.663,653 ක් ගෙවා තිබුණි. |
| (උ) | 1975 නොවැම්බර් 05 දිනැති අංක 57/75 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාගේ චක්‍රලේඛය | ද්විතීයික ශ්‍රේණි සඳහා මසකට රු. 5 ක් හා මූලික ශ්‍රේණි සඳහා මසකට රු. 3 බැගින් පහසුකම් ගාස්තු අයකළ යුතු වුවත් හොරණ දොන් පේදිරික් විද්‍යාලය විසින් වර්ෂ ගණනාවක සිට 1 වසරේ සිට 13 වසර දක්වා සියලුම සිසුන්ගෙන් මසකට රු. 5 බැගින් පහසුකම් හා සේවා ගාස්තු අයකර තිබුණි. |
| (ඌ) | ගුරු සංඛ්‍යාව නිර්ණය කිරීම සම්බන්ධ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 2003 නොවැම්බර් 07 දිනැති අංක 2003/38 චක්‍රලේඛය | (i) හොරණ දොන් පේදිරික් විද්‍යාලයේ සිසුන් සංඛ්‍යාව අනුව අධීක්ෂණ ගුරුවරුන් දෙදෙනෙකුගේ හා ගුරුභවතුන් 25 දෙනෙකුගේ අතිරික්තයක් තිබුණි.<br>(ii) චක්‍රලේඛයේ 2.1.3 ඡේදයේ උපදෙස් ප්‍රකාර විෂය ඉගැන්වීමේ නියුතු ගුරුභවතෙකු සාමාන්‍යයෙන් සතියකට විනාඩි 40 ක කාලපරිච්ඡේද 35 ක්ද ඊට අමතරව පන්තියක්ද භාරව ක්‍රියාකරන ගුරුභවතකු කාලපරිච්ඡේද 33 ක්ද, උසස් පෙළ ඉගැන්වීමේ කටයුතු කරන ගුරුභවතකු සතියකට අවම කාලපරිච්ඡේද 30 ක්ද ඉගැන්වීමේ කටයුතුවල නිරත වියයුතු විය. |

එසේ වුවත් හොරණ දොන් පේදිරික් විද්‍යාලයේ ගුරු කාලසටහන් කාලපරිච්ඡේදවල අවමය තීරණය කිරීමේදී පුස්තකාල කාලපරිච්ඡේදය ඇතුළත් කර තිබූ බවත් ඒ ආකාරයට ගුරුභවතුන් 14 දෙනෙකුට සතියකට කාලපරිච්ඡේද 81 ක් පුස්තකාල කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ බවත් නිරීක්ෂණය විය.

(එ) පළාත් සභා මූල්‍ය රීති 54

(i) පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අයකර ගැනීමට, කපා හැරීමට හෝ අත්හැරීමට ඇති වසර 03 අඩු රු. 6,458,290 ක් වටිනා අලාභ හානි සිද්ධි 37 ක්, වසර 5-10 අතර රු.2,653,655 ක් වටිනා අලාභ හානි සිද්ධි 31 ක් හා වසර 10 ට වැඩි රු. 4,743,843 ක් වටිනා අලාභ හානි සිද්ධි 69 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු. 6,789,182 ක අලාභ සිදුවූ වාහන අනතුරු 92 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 3 ආදායම් හා වියදම් කළමනාකරණය

### 3.1 ආදායම්

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විචලනයන් සහිත සාරාංශයක් පහත දැක්වේ.

| | 2014 | | | 2013 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තත්‍ය | විචලනය | අයවැයගත | තත්‍ය | විචලනය |
| පළාත් සභා විෂයන්ට අදාල ආදායම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බදු ආදායම් | 28,284,973,000 | 28,112,652,917 | 172,320,083 | 27,302,025,000 | 22,262,325,180 | 5,039,699,820 |
| බදු නොවන ආදායම් | 2,992,291,000 | 2,979,181,771 | 13,109,229 | 2,815,230,000 | 3,259,241,399 | (444,011,399) |
| රජයේ ප්‍රදාන | 14,526,099,000 | 13,306,497,120 | 1,219,601,880 | 11,490,501,000 | 11,367,755,000 | 122,746,000 |
| එකතුව | 45,803,363,000 | 44,398,331,808 | 1,405,031,192 | 41,607,756,000 | 36,889,321,579 | 4,718,434,421 |

## 3.2 වියදම්

| වියදම් | 2014 අයවැයගත | 2014 තත්‍ය | 2014 විචලනය | 2013 අයවැයගත | 2013 තත්‍ය | 2013 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පෞද්ගලික පඩිනඩි | 25,341,691,399 | 25,119,406,935 | 222,284,464 | 22,832,178,812 | 22,220,542,279 | 611,636,533 |
| අනෙකුත් | 13,682,034,201 | 13,462,640,733 | 219,393,468 | 12,583,219,117 | 12,212,444,426 | 370,774,691 |
| පුනරාවර්තන | 39,023,725,600 | 38,582,047,668 | -441,677,932 | 35,415,397,929 | 34,432,986,705 | 982,411,224 |
| ප්‍රාග්ධන | 6,779,637,400 | 5,863,476,034 | 916,161,366 | 6,192,358,071 | 5,054,877,130 | 1,137,480,941 |
| එකතුව | 45,803,363,000 | 44,445,523,702 | 1,357,839,298 | 41,607,756,000 | 39,487,863,835 | 2,119,982,165 |

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන හා මූලධන වියදම් අනුපාතය 7 :1 ක් විය.

## 3.3 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට හා ආසන්නතම ඉකුත් වර්ෂ දෙකක අවසානයට හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට 2014 | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| බදු ආදායම | 1,149,785,270 | 769,607,586 | 1,138,048,276 |
| බදු නොවන ආදායම | 5,162,163,276 | 764,074,279 | 394,127,295 |
| | 6,311,948,546 | 1,533,681,865 | 1,532,175,571 |

මෝටර් වාහන ආදායම් බලපත්‍ර ගාස්තුවලට අදාලව පසුගිය වර්ෂවල හිඟ ආදායම් ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම් ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ හිඟ ආදායම පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 312 කින් වර්ධනය වී තිබුණි.

## 4. මූල්‍ය සමාලෝචනය

---------------------

### 4.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පලාත් සභා අරමුදලේ රු. 47,191,904 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,598,542,256 ක් විය.

## 5. අධිකාරි ගිණුම්

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තියේ 16(1) වගන්තිය ප්‍රකාරව ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියලු මුදල් අරමුදලට බැරකරනු ලැබිය යුතු වුවත් වෙනත් ආයතනවලට ආරක්ෂක සේවා සැපයීමෙන් ලබාගත් මුදල් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ අරමුදලට බැර නොකර 2012 ජූලි 06 දින සිට වෙනම බැංකු ගිණුමකට බැරකර තිබුණි. තවද ආරක්ෂක සේවා ව්‍යාපෘතියට අදාල වියදම් මෙම බැංකු ගිණුමෙන් සිදුකර තිබූ බැවින් මෙම ව්‍යාපෘතියේ මූල්‍ය පාලනය හා අධීක්ෂණය කාර්යාංශයේ පරිපාලනයෙන් බැහැර වී තිබුණි.

(ආ) 2007 අංක 01 දරන බස්නාහිර පලාත් සභාවේ අපද්‍රව්‍ය කලමනාකරණ ප්‍රඥප්තිය 11 කොටසේ 7 (2) අනුව පලාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ වලින් පරිසරයට එකතුවන අපද්‍රව්‍ය උපරිම ලෙස වලක්වා පලාතේ මහජනයාගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද යහපත උදෙසා පරිසරය පිරිසිදුව තබා ගැනීමට අවශ්‍ය විධිවිධාන සැලසීම අරමුණු කරගෙන තිබුණි. එසේ වුවද පලාත් පාලන ආයතන හා අනෙකුත් බාහිර ආයතන වලින් ලැබෙන (දළ වශයෙන් දිනකට ටොන් 500 ක් පමණවූ) කසල අවිධිමත්ව කරදියාන ඉඩමට බැහැර කර තිබූ අතර, එමගින් අධිකාරිය උපයා තිබූ ආදායම මුළු ආදායමින් 90% පමණ විය. කරදියාන ඉඩමට විධිමත් නොවන පරිදි කසල බැහැර කිරීමෙන් පරිසරයට වන හානිය සම්බන්ධයෙන් මහජනතාවගෙන් හා වෙනත් ආයතන වලින් විරෝධතා එල්ලවී තිබියදී ඒ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි

## 6. මෙහෙයුම් සමාලෝචනය

### 6.1 කාර්ය සාධනය

#### 6.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබූ ප්‍රතිපාදනයන් සහ වැය කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රභවය | ලැබී තිබූ ප්‍රතිපාදනය | වියදම | උපයෝජනය ඌන/(අධි) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| (i) උපමාන පාදක ප්‍රදාන | 292,500,000 | 803,195,544 | (510,695,544) |
| (ii) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 508,000,000 | 1,112,290,996 | (604,290,996) |
| (iii) වතු පාසැල් සංවර්ධන වැඩසටහන | 25,000,000 | 23,248,339 | 1,751,661 |
| (iv) ද්විතීයික පාසැල් 1000 වැඩසටහන | 65,000,000 | 60,592,282 | 4,407,718 |
| (v) වෙනත් ප්‍රදාන | | | |
| ලෝක බැංකු ආධාර - අධ්‍යාපන | 236,684,120 | 335,185,948 | (98,501,828) |
| -සෞඛ්‍ය | 180,000,000 | 154,671,552 | 25,328,448 |
| නව කාර්යාල සංකීර්ණය | 300,000,000 | 1,080,987,461 | (780,987,461) |
| | 1,607,184,120 | 3,570,172,122 | (1,962,988,002) |

#### 6.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහාවූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රුපියල් මිලියන 4,865 ක ඇස්තමේන්තු අගයකට වූ වැඩ යෝජනා 7,335 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව වැඩ යෝජනාවල ප්‍රගතිය පහත වගුවෙහි දැක්වේ.

| | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා ගණන | මුළු වැඩවල ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|
| | | | | රු. මිලියන |
| (අ) සම්පූර්ණයෙන් නිම කළ | 6,289 | 73 | 6,362 | 4,015 |
| (ආ) 50% කට වඩා අඩුවෙන් නිම කළ | 183 | - | 183 | 130 |
| (ඇ) 50% කට වඩා වැඩියෙන් නිම කළ | 130 | - | 130 | 253 |
| (ඈ) ආරම්භකර නොතිබූ | 616 | 02 | 618 | 450 |
| (ඉ) මතභේදයට තුඩුදෙන / ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 42 | - | 42 | 17 |
| | 7,260 | 75 | 7,335 | 4,865 |

**6.1.3** විභාග ප්‍රතිඵල

--------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසැල් 97 කින් 2014 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනීසිටි සිසුන් අතරින් සියයට 50 කට වැඩි ප්‍රතිශතයක් සමත්ව තිබූ පාසල් ගණන 26 ක් විය. පාසල් 12 කින් එම විභාගයට ඉදිරිපත්වූ සිසුන් 98 දෙනාම අසමත්ව තිබූ අතර, පාසල් 61 ක සිසුන්ගෙන් සියයට 50 ට වැඩි ප්‍රතිශතයක් අසමත්වී තිබුණි. තවද 2013 සහ 2014 වර්ෂවලදී ඉහත විභාගය සඳහා ඉදිරිපත්වූ සිසුන්ගෙන් පිළිවෙලින් සියයට 52 ක් සහ සියයට 46 ක් වශයෙන් ගණිතය විෂයය අසමත්ව තිබීම තුළ විභාග ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන්වල අවශ්‍යතාවය මතුව තිබුණි.

(ආ) ගම්පහ අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් 92 කින් 2014 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත්වූ සිසුන් 5,057 දෙනෙකුගෙන් සියයට 44.5 ක් හෙවත් සිසුන් 2,353 දෙනෙක් උසස් පෙළ විෂය ධාරාවන් හැදෑරීම සඳහා සුදුසුකම් ලබා නොතිබූ අතර, ඉකුත් වර්ෂයට සාපේක්ෂව උසස් පෙළ හැදෑරීම සඳහා සුදුසුකම් නොලැබූ ප්‍රතිශතය සියයට 5.5 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) කැලණිය අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් 73 කින් 2014 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත්වූ සිසුන් 4,734 දෙනෙකුගෙන් සියයට 49 ක් හෙවත් සිසුන් 2,335 දෙනෙක් පමණක් උසස් පෙළ අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලබා තිබුණි. තවද කලාපයේ එක් එක් පාසල්වල සිසුන් ඉහත විභාගය සමත්වීමේ ප්‍රතිශතය සලකා බැලීමේදී පාසල් 04 ක පමණක් සිසුන්ගෙන් සියයට 75 කට වැඩි ප්‍රතිශතයක් සමත්වී තිබුණද, පාසල් 35 ක එකී ප්‍රතිශතය සියයට 10 සිට 40 දක්වා වීම හා තවත් පාසල් 06 ක කිසිම සිසුවෙක් සමත් නොවීමේ හෝ සියයට 10 කට අඩු ප්‍රතිශතයකින් සමත්වීමේ තත්ත්වයක් සිදුව තිබුණි.

(ඈ) මීගමුව අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල් 86 කින් 2014 වර්ෂයේ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනීසිටි සිසුන්ගෙන් සියයට 54 කට සමාන සිසුන් ප්‍රමාණයක් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලබා නොතිබුණි. පාසල් 33 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත්වූ සිසුන් 1,019 දෙනෙකුගෙන් 181 දෙනෙකු පමණක් සමත්ව තිබීම තුළ එකී පාසල්වල සිසුන් සමත්වීමේ ප්‍රතිශතය සියයට 0 සිට 23 අතර ප්‍රමාණයක පැවතුණි.

**6.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**---------------------------------**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සේවක ණය ලබාදීමේදී හා එම ණය අයකර ගැනීමේදී චක්‍රිය අරමුදලක් මාර්ගයෙන් සිදුනොකර, බැංකුවේ තබන ලද තැන්පතුවකින් නිවාස ණය ගෙවීම හා පොදු අරමුදලින් අනෙකුත් ණය ගෙවීමද සිදුකර තිබුණි. 2000 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් අරමුදලේ ශේෂය රු. මිලියන 5 ලෙස පවත්වා ගැනීමට අනුමැතිය ලැබී තිබූ නමුත් වර්තමානයේදී (තැන්පත් මුදල) රු. මිලියන 81.5 දක්වා වැඩිවී තිබුණි. මෙලෙස අවිධිමත් ආකාරයෙන් සේවක ණය ගෙවීම නිසා 2014 දෙසැම්බර් 31 දින වනවිට විවිධ හේතූන් මත අයකරගත නොහැකි ණය ශේෂය රු.2,580,805 ක් විය.

(ආ) හෝමාගම අධ්‍යාපන කලාපයේ පාසැල් 23 ක ප්‍රයෝජනයට නොගත් ගුණාත්මක යෙදවුම් මුදල්වල වටිනාකම රු. 18,685,515 ක්ව තිබියදී එම පාසැල් සඳහා 2014 වර්ෂයේදී තවත් රු.4,830,880 ක මුදලක් ලබාදී තිබුණි.

(ඇ) ඉන්දියානු රජයේ පරිත්‍යාගයක් ලෙස පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ලැබී තිබූ පරිගණක භාෂා විද්‍යාගාරය, පළාත තුළ පිහිටි සියළු කලාපවලට අයත් පාසැල්වල ගුරුවරුන්ට හා නිලධාරීන්ට පහසුවෙන් ළඟාවිය නොහැකි කැලණිය කලාපයේ පාසැලක ස්ථාපිත කර තිබුණි. අනෙකුත් සාමාන්‍ය පරිගණක විද්‍යාගාරවල නොමැති විශේෂිත වූ පහසුකම් රැසක් පවතින මෙම පරිගණක භාෂා විද්‍යාගාරය, ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන් සඳහා ශ්‍රවන හා කථන ඉංග්‍රීසි මෘදුකාංග භාවිතා කරන ආකාරය පිළිබඳ වූ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීමට යොදවා නොගෙන සාමාන්‍ය පරිගණක පුහුණු ක්ෂේත්‍රයට පමණක් සීමාවී තිබුණි.

(ඈ) කො / අගමැති විද්‍යාලයේ ගුරුවරයෙකු 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර රටින් බැහැර යාම සඳහා අනුමැතියක් ලබානොගෙන 2007 මාර්තු සිට 2014 දෙසැම්බර් දක්වා කාලය තුළ අවස්ථා 21 කදී විදේශගතවී තිබුණි. තවද මෙම ගුරුවරයා විදේශගතවී තිබූ සමහර දිනයන් සඳහා පැමිණීමේ ලේඛණයේ අත්සන් කර තිබූ බවත් අනුමැතියක් ලබා නොගෙන විදේශගතවූ කාලයට අදාලව මාසික සම්පූර්ණ වැටුපද ගෙවා තිබූ බවත් විගණනයේදී අනාවරණය විය. මේ ආකාරයට අනුමැතියෙන් තොරව විදේශගතවීමට ඉඩහැරීම, විදේශගතවූ දිනයන් සඳහා පැමිණීම අත්සන් කිරීමට ඉඩ සැලසීම හා විදේශගතවූ කාලයට වැටුප් ගෙවීම යනාදී අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් මෙම

ගුරුවරයාට, විදුහල්පතිවරයාට හා අනෙකුත් වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කිරීමේදී මන්දගාමී තත්ත්වයක් පවතින බවත් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ඉ) බස්නාහිර පළාතේ සියලුම ග්‍රාමීය බැංකු සහ මූල්‍ය සේවා සිදු කරන සමූපකාර සමිති නියාමනය කිරීමේ වගකීම පිළිබඳ බස්නාහිර පළාත් සභාවේ 2011 අංක 04 දරන සමූපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් පැවරී ඇති නියමයන් හා 2014 ජූලි 07 දින පැවති ජාතික නියාමන කමිටුවේ උපදෙස් ප්‍රකාරව සමූපකාර සමිති සඳහා දින 100 කින් යුත් වැඩසටහනක් 2014 අගෝස්තු 15 දින සිට ක්‍රියාත්මක කරන ලෙසත් දන්වා තිබුණි. කොළඹ දිස්ත්‍රික්කයේ බොහෝමයක් සමූපකාර සමිති එම වැඩසටහන් ආරම්භ කර තිබුණේ 2014 දෙසැම්බර් මාසයේදී වූ අතර කළුතර දිස්ත්‍රික්කයේ හා ගම්පහ දිස්ත්‍රික්කයේ බොහෝ සමිතිවල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම දින 100 වැඩසටහන යටතේ සියලුම තැන්පත් හා ආයෝජන පරිගණක ගත කිරීම කළ යුතු වුවත් කළුතර දිස්ත්‍රික්කයේ ඇති ග්‍රාමීය බැංකු 94 කින් බැංකු 37 ක් පරිගණක ගත කිරීම් ආරම්භ කර නොතිබුණි. තවද නියාමන කමිටු චක්‍රලේඛ හා උපදෙස් පරිදි ග්‍රාමීය බැංකුවල මාසික ද්‍රවශීලතාවය ධන අගයක පවත්වා ගත යුතු වුවද කොළඹ දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු 04 ක ද්‍රවශීලතාවය ඍණ අගයක් ගෙන තිබූ බවත් නිරීක්ෂණය විය.

(ඊ) 1972 අංක 72 දරන ගෙවල් කුලී පනත ක්‍රියාත්මක කිරීමේ අරමුණින් නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව මගින් ගෙවල් කුලී මණ්ඩල 14 ක් ස්ථාපිත කර කුලී නිවැසියන් ආරක්ෂා කිරීම සඳහා කුලී නිවැසියන් හා නිවාස හිමිකරුවන් අතර පවතින ගැටලු නිරාකරණය කර දීමට කටයුතු කර තිබුණි. පැලියගොඩ, අවිස්සාවේල්ල, බත්තරමුල්ල හා දෙහිවල ගල්කිස්ස යන ස්ථානවල පවත්වා තිබූ ගෙවල් කුලී මණ්ඩල සමාලෝචිත වර්ෂයේදී අක්‍රියව පැවතීම හේතු කරගෙන කුලී නිවැසියන් දැඩි අපහසුතාවයට පත්වීම නිසා ගෙවල් කුලී බල මණ්ඩල පැවැත්වීමේ අරමුණු සාක්ෂාත් කරගත නොහැකි වී තිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(උ) මහජන සේවාවන් සඳහා යොදනු ලබන වෙළඳ වාහන වෙනුවෙන් යෝග්‍යතා සහතික නිකුත් කිරීම පිණිස ගරාජ හිමියන් වෙත තිබිය යුතු සුදුසුකම් 1992 දෙසැම්බර් 15 දිනැති අංක 745/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත් කර තිබුණි. මීට අමතරව යෝග්‍යතා සහතික නිකුත් කිරීමේදී පිළිපැදිය යුතු උපදෙස් මාලාවක් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ 2013 සැප්තැම්බර් 01 දිනැති අංක බප/මෝප්‍ර/2/8/18 දරන චක්‍රලේඛය මඟින් නිකුත් කර තිබූ නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ 2014 හා 2015 වර්ෂවල ලියාපදිංචි කර තිබූ ගරාජ බොහෝමයක එම උපදෙස් මාලාවේ පිළිපැදිය යුතු අවශ්‍යතා සපුරා නොතිබුණි.

(ඌ) බස්නාහිර පළාත තුළ ලියාපදිංචි ළමා නිවාස සංඛ්‍යාව 120 ක් පමණ වූ නමුත් වාර්ෂිකව නඩත්තු ආධාර ඉල්ලුම් කර තිබුණේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 75කට අඩු ප්‍රමාණයක් විය. සමාලෝචිත වර්ෂයට නඩත්තු ආධාර ගෙවීම සඳහා රු.21,500,000 ක මුදලක් වෙන් කර තිබූ නමුත් එයින් රු.1,100,000 ක් වෙනත් වැය

විෂයයන්ට මාරු කර තිබීමෙන් පසුවද රු.2,854,444 ක් ඉතිරි වී තිබුණි. ආධාර ඉල්ලුම් නොකරන ළමා නිවාස ආධාර ඉල්ලුම් කිරීම සඳහා උනන්දු කරවීම හා ලියාපදිංචි නොකළ ළමා නිවාස ලියාපදිංචි කරවීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට පරිවාස නිලධාරීන් සතු වගකීම නිසි ආකාරව ඉටු නොවීම මෙයට හේතුවී තිබුණි.

(එ) ළමා සංවර්ධන මධ්‍යස්ථානවල දරුවන්ගේ සුභසාධනය වෙනුවෙන් මූල්‍ය ආධාර ලබාදී ආයතනගත ළමුන් සමාජගත කිරීම සඳහා වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නොවන සංවිධානයක් සමඟ ඇතිකරගත් ගිවිසුම පරිදි 2013 වර්ෂය සඳහා රු.1,093,305 ක ආධාර වෙන්කර තිබුණි. මෙයින් ව්‍යාපෘති සඳහා යොදා ගෙන තිබුණේ රු.674,753 ක මුදලක් වූ බැවින් වෙන්කළ මුදලින් රු.418,552 ක් හෙවත් සියයට 38 ක් ඌන උපයෝජිතව පැවතුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා රු. 1,789,025 ක ආධාර ලැබී තිබූ අතර ගිවිසුම් ප්‍රකාර විදේශ අනුග්‍රහය සහිත ව්‍යාපෘතිය 2014 ජූලි 31 දිනෙන් අවසන් වී ඇතත් දරුවන්ගේ සුභසාධනය සඳහා මහත් රුකුලක් වී තිබූ මෙම ව්‍යාපෘතියට යළිත් එවැනි අනුග්‍රාහකත්වයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ළමුන් ආයතනගත කිරීම අවම කිරීමට හා ඔවුන් සමාජගත කිරීමටත්, නිවාස ආධාර ලබා දීම හා අඩු ආදායම්ලාභී පවුල් වෙත මහන මැෂින් ලබා දීම සඳහා යූනිසෙෆ් ව්‍යාපෘතිය යටතේ ආධාර වශයෙන් 2012 හා 2013 වර්ෂවලදී රු.3,941,000 ක් ලැබී තිබුණි. වර්ෂ ගණනාවක සිට ක්‍රියාත්මක වී තිබූ මෙම ව්‍යාපෘතිය ළමුන් ආයතනගත කිරීම අවම කිරීමේ වැඩපිළිවෙළ සඳහා මහත් පිටිවහලක් වී තිබුණද ඉදිරි වර්ෂයන් සඳහාද ක්‍රියාත්මක කරවා ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ඔ) බස්නාහිර පළාත් පරිවාස නිලධාරීන් විසින් වයඹ පළාත් පරිවාස නිළධාරීන්ගේ නිර්දේශයක් ලබාගැනීමෙන් තොරව වයඹ පළාත් පරිවාස කොමසාරිස් යටතේ පාලනය වන මැල්සිරිපුර ආලෝක ළමා නිවාසයට ළමුන් ඇතුළත් කිරීම සඳහා අධිකරණයට කරුණු දක්වා අධිකරණ නියෝග ලබාගෙන තිබුණි. මෙම තත්ත්වය නිසා වයඹ පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට දරුවන්ගේ අධ්‍යාපනය හා අනාගත සුරක්ෂිතතාව සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම ගැටළු සහගත වී ඇති බව වාර්තා වී තිබූ නමුත් ඒ පිළිබඳව බස්නාහිර පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ගෙන ඇති පියවර පිළිබඳ තොරතුරු කිසිවක් අනාවරණය නොවීය.

(ඕ) ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක ක්‍රීඩා සමාජ 50 කට ක්‍රීඩා උපකරණ ලබා දීම සඳහා 2014 වර්ෂයේදී රු.1,080,000 ක් වැයකර සැහැල්ලු පන්දු ක්‍රිකට් පිති 200 ක්, ටෙනිස් බෝල ටින් 200 ක්, අත්පන්දු 100 ක්, අත්පන්දු දැල් 100 ක් හා විකට් කට්ටල 200 ක් බෙදාදී තිබූ නමුත් අදාල උපකරණ ලබාදී තිබූ ක්‍රීඩා සමාජ 2014 වර්ෂය සඳහා ලියාපදිංචි කර නොතිබුණි

(ක) 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ඉලක්ක කොට 2013 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ක්‍රියාත්මක වැඩසටහනක් ලෙස දිස්ත්‍රික්ක තුනෙහි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංචිත ගත කර පුහුණුව ලබා දීම සඳහා

තෝරාගෙන 2013 දෙසැම්බර් මාසයට පෙර ඔවුන්ට බෙදාදීමට රු.793,575 ක් වැය කොට ක්‍රීඩා ඇඳුම් මිලදී ගෙන තිබුණි. නමුත් මෙසේ මිලදී ගෙන තිබූ ක්‍රීඩා ඇඳුම් 2015 මාර්තු අවසානය වන විටත් නිකුත් නොකර ගබඩාවේ රඳවාගෙන තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ග) බස්නාහිර පළාත් ක්‍රීඩා විද්‍යායතනයේ 2014 වර්ෂයේ කාර්යය සාධන සැලැස්ම අනුව වර්ෂය තුළ පැවැත්වීමට යෝජිත පාඨමාලා ගණන 43 ක් වූවද 2014 වර්ෂයේ පවත්වා තිබුණේ පාඨමාලා 06 ක් පමණි. තවද කාර්ය සාධන සැලැස්මේ ප්‍රධාන අරමුණු ලෙස සඳහන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ සිද්ධාන්ත පිළිබඳව දැනුම ලබා දීම ,බස්නාහිර පළාතේ මෙතෙක් පසුබැස ඇති ක්‍රීඩා තත්වයන් නිරීක්ෂණය කර ඒවා නිවැරදිව සකස් කිරිම, පළාත තුළ ක්‍රීඩා සමාජ හා ක්‍රීඩා ලෝලීන් අතර දැනුම මිනුම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා පුහුණු කරුවන් පුහුණු කිරීම හා ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විශේෂ පුහුණුව ලබාදීම පිළිබඳ පුහුණු කරුවන් මනා ලෙස දැනුවත්කිරීම වැනි කරුණු කෙරෙහි යොමු වී නොතිබුණි.

(ච) රුපියල් මිලියන 5.5 ක වියදමින් 2011 වර්ෂයේ පිළිසකර කර තිබූ වතුපිටිවල රෝහල් ළිඳේ ජලය පාවිච්චියට නුසුදුසු බවට තහවුරුවීම නිසා 2011 වර්ෂයේ සිටම එම ළිඳ භාවිතයට ගෙන නොතිබූ අතර, රෝහලේ ජල අවශ්‍යතාවයන් බාහිරින් සපයා ගැනීම වෙනුවෙන් මාසිකව රු. 600,000 ක ජල ගාස්තුවක් ගෙවීමට සිදුව තිබුණි.

(ජ) වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ විසින් විවිධ හේතූන් මත භාවිතයෙන් ඉවත්කර තබන ලෙස දන්වා තිබූ ඖෂධ වර්ග 09 ක් වතුපිටිවල රෝහලේ නේවාසික රෝගීන්ට හා බාහිර රෝගීන්ට නිකුත් කර තිබුණි.

(ට) පළාත් සභා අරමුදලින් වතුපිටිවල රෝහල සඳහා ඔක්සිජන් ලබාගැනීමට හා වෙනත් අත්තිකාරම් ලෙස 2013 වර්ෂයේ නිකුත් කළ රු. 8,361,435 ක අතුරු අග්‍රිම 2014 නොවැම්බර් මාසය වනවිටත් මධ්‍යම රජයෙන් ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි.

(ඩ) 2006 අංක 03 දරන බස්නාහිර පළාත් සමාජ සේවා ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුව බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන වැඩිහිටියන් සඳහා වූ නිවාස, ආබාධිතයන් සඳහා වූ නිවාස සහ ඔවුන් සඳහා සේවා සපයන ආයතන සියල්ලක්ම සමාජසේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළයුතු වූවත් මේ වනවිට ලියාපදිංචි කර ඇත්තේ වැඩිහිටි නිවාස 73 ක් හා අබාධිත නිවාස 39 ක් පමණි. ඒ අනුව ලියාපදිංචි නොවූ වැඩිහිටි හා ආබාධිත නිවාස විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මකව තිබූ අතර එම ආයතන ලියාපදිංචි කරවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ත) රු. 90,548,720 ක් වැයකර 2014 ජුනි 30 දින වනවිට වැඩ අවසන්වී තිබූ මොල්ලිගොඩ පංචකර්ම මධ්‍යස්ථානය සඳහා රු. 2,157,000 ක් වටිනා බඩු බාහිරාදියද ලබාදී තිබූ නමුත් 2015 ජූලි මාසය අවසන් වනවිටත් රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා විවෘත කර නොතිබුණි. මෙම මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම හා ප්‍රතිකාර කිරීමේදී අයකළ යුතු මිල ගණන් අනුමත කර නොතිබීම, ප්‍රතිකාර ආරම්භ කිරීම ප්‍රමාදවීමට හේතුවී ඇති බවත් ඒ හේතුවෙන් බස්නාහිර පළාතේ ජනතාවට ඵලදායී හා කාර්යක්ෂම දේශීය වෛද්‍ය සේවාවක් ලබාගැනීමට තිබූ අවස්ථාවක් අහිමිවී ඇති බවත් නිරීක්ෂණය විය.

(ද) මතුගම මිහිඳු මහා විද්‍යාලයේ මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයේ ඉදිකිරීම් අවසන් කර වර්ෂයකට අධික කාලයක් ගතවී තිබුණද එහි කටයුතු ආරම්භ කර නොතිබූ අතර 2013 දෙසැම්බර් සිට විවිධ අවස්ථාවලදී විද්‍යාගාරය වෙත ලැබී තිබුණු ද්‍රව්‍ය හා උපකරණ විදුහලේ තැන් තැන්වල ගොඩගසා තිබුණි.

(න) සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයීම් අංශයෙන් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ මගින් නියැදි අසමත් හා තත්ත්වයෙන් බාල ලෙස හඳුනාගත් ඖෂධ ඉවත්කිරීම සඳහා උපදෙස් ලබාදීමේ ප්‍රමාදයන් හේතුවෙන් රු. 1,160,249 ක්වූ එවැනි ඖෂධ වර්ග 04 කින් රු. 642,307 ක්වූ ඖෂධ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීමේ අංශය විසින් රෝහල් වෙත බෙදාහැර තිබුණි.

(ප) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම්වල හා රක්ෂිතවල 1950 වර්ෂයේ පමණ සිට අනවසරයෙන් පුද්ගලයින් 845 දෙනෙකු පදිංචිවී සිටි අතර මෙම අනවසර පදිංචිකරුවන් විසින් භුක්තිවිඳින ඉඩම් ප්‍රමාණය කොතෙක්ද යන්න ගණනය කර වාර්තා තබාගෙන නොතිබුණි.

(බ) කළුතර දිස්ත්‍රික්කයේ ළමා හා මාතෘ සායනවලින් 2014 වර්ෂය සඳහා මාසිකව හා ත්‍රෛයිමාසිකව ලැබිය යුතු වාර්තා නොලැබීම නිසා සායන සඳහා සහභාගීත්වය, මාතෘ දාරක පෝෂණය, දරු උපත් හා මරණ, මාතෘ සංරක්ෂණය, රුධිර පරීක්ෂණ, ප්‍රතිශක්තිකරණ හා පවුල් සංවිධාන සේවා වැනි කාර්යයන් පිළිබඳ දත්ත කොට්ඨාශ මට්ටමින් දිස්ත්‍රික් මට්ටම දක්වා ඉදිරිපත් නොවීම නිසා ජාතික මට්ටමින් සකස් කරන විශ්ලේෂණාත්මක තොරතුරු පද්ධතිය නිසි පරිදි යාවත්කාලීන කර ගැනීමට නොහැකිවී තිබුණි.

(ම) රාගම ජල සම්පාදන යෝජනා ක්‍රමයේ අත්‍යාවශ්‍ය ඉදිකිරීම් සඳහා පර්චස් 165 ක්වූ ඉඩමක් පවරා ගැනීමට රු. 1,031,250 ක මුදලක් 2001 ඔක්තෝබර් මාසයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ජාඇල ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදී තිබුණි. 2001 ජූලි 30 දිනැති අංක 135-3 දරන ගැසට් නිවේදනය මගින් එම ඉඩම් අත්පත් කරගැනීම ප්‍රකාශයට පත්කර තිබුණද, 2014 දෙසැම්බර් 31 වනවිටද අදාල ඉඩම ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත පැවරීමට ප්‍රාදේශීය ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි.

## 6.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 6.3.1 අධ්‍යාපන

(අ) 2014 වර්ෂයේදී බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 40 ක ශිෂ්‍යයින් 5,525 ක් සඳහා පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් රු. 33,129,000 ක අධ්‍යාපන ආධාර ලබාදී තිබූ නමුත් මෙම අධ්‍යාපන ආධාර බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන්ද ලබාදී තිබූ බැවින් ආයතන 2 කින් එකම කාර්යක් සඳහා වියදම් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2013 වර්ෂයට පාසල් පාදක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු. 9,936,758 ක මුදලක් මතුගම අධ්‍යාපන කලාපයේ පාසල් 128 ක් වෙත ලබාදී තිබුණි. නමුත් ඉන් පාසල් 92 ක රු.4,445,755 ක් වැයකර ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබුණද පාසල් 36 ක

කිසිදු ව්‍යාපෘතියක් සිදුකර නොතිබුණි.

(ඇ) ශිෂ්‍ය සංඛ්‍යාව 194 ක් සිටින කොළඹ දිස්ත්‍රික්කයේ පාසැලක ශිෂ්‍යයින් 30 කට අකුරු කියවීමට හා ලිවීමට නොහැකි බව අනාවරණය වූ අතර මෙම ශිෂ්‍යයින්ගෙන් 17 දෙනෙකු ද්විතීයික අධ්‍යාපනය ලබන අය විය.

(ඈ) හොරණ මිහිඳු මධ්‍ය මහා විද්‍යාලයට ගුණාත්මක යෙදවුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ රු. 479,955 ක් හා පෙර වර්ෂවල ඉතිරි ශේෂය වූ රු. 951,779 ක් වශයෙන් සමස්ථ ශේෂය වූ රු.1,431,734 ක් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**6.3.2 සෞඛ්‍ය**

(අ) ගම්පහ දිස්ත්‍රික් රෝහලට 2014 වර්ෂයට අවශ්‍ය ඖෂධ වර්ග 05 කට අදාල ඇස්තමේන්තුගත වටිනාකම රු. 1,833,148 ක්වූ ඖෂධ සහ එන්නත් වර්ග 1,532 ක් රෝහලට නොලැබීම හේතුවෙන් එම ඖෂධවල නිරන්තර හිඟයක් පැවතුණි.

(ආ) මීරිගම මූලික රෝහලේ ශල්‍යාගාර සැත්කම් සිදු නොකරන බැවින් වර්ෂ 05 ක පමණ පෙර සිට රෝහලට සපයා තිබුණු ඔක්සිජන් සහිත සිලින්ඩර් 16 ක් පාවිච්චියෙන් තොරව පැවති අතර ඒවා වෙනත් රෝහලකට යැවීමකින් තොරව ගබඩාවේ රඳවාගෙන තිබුණි. තවද මෙම රෝහලේ අංග සම්පූර්ණ ශල්‍යාගාරයක් හා අනෙකුත් කාර්ය මණ්ඩල සහිත වාට්ටු තිබියදී විශේෂඥ වෛද්‍යවරුන් නොසිටීම මත එකී භෞතික සම්පත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) මන්ද පෝෂණය තුරන් කිරීමේ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක වන ත්‍රිපෝෂ බෙදාදීමේ ව්‍යාපෘතිය යටතේ මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බල ප්‍රදේශයට 2014 ජනවාරි, මාර්තු, අප්‍රේල්, ජූනි සහ දෙසැම්බර් මාස සඳහා ත්‍රිපෝෂ ලබාදීමට හඳුනාගත් පිරිස 9,599 දෙනෙකු විය. නමුත් උක්ත මාසවලට අදාලව ත්‍රිපෝෂ ලබාදී තිබුණේ 4,987 දෙනෙකුට පමණක් වූයෙන් එම මාසවලදී අඩු බර දරුවන් / ගර්භනී මවුවරුන් 4, 612 දෙනෙකුට ත්‍රිපෝෂ ලැබී නොතිබුණි.

(ඈ) ගම්පහ දිස්ත්‍රික් රෝහලේ රු.1,211,017 ක් වටිනා Dextran 40% මිලිලීටර 500 බෝතල් 695 ක් භාවිතයෙන් තොරව පැවතුණි.

**6.3.3 වෙනත්**

(අ) මෝටර් රථවාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමට පැමිණෙන පාරිභෝගික ජනතාවට තැරැව්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සපයා මහජනතාවගේ මුදල් ලබා ගැනීමෙන් ව්‍යාජ බලපත්‍ර ලබාදීමේ ජාවාරමක් පවතින බව විගණනයේදී අනාවරණය වූ ව්‍යාජ ආදායම් බලපත්‍ර සංඛ්‍යාව අනුව තහවුරු විය. මහජනයා ව්‍යාජ බලපත්‍ර ලබාගැනීම නිසා පළාත් සභාවට ලැබිය යුතු විශාල ආදායම් ප්‍රමාණයක් නොලැබී යන තත්ත්වයක් මේ මගින් ඇති වී තිබුණි. වර්ෂ ගණනාවක සිට මෙවැනි ව්‍යාජ බලපත්‍ර නිකුත් වී තිබියදීත් කාර්යාලය අවට මෙවැනි තැරැව්කරුවන් ගැවසෙන බවට මහජනයා දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට හා හඳුනාගෙන ඇති එවැනි ව්‍යාජ බලපත්‍ර සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට වගකිවයුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) රුපියල් මිලියන 914 ක ඇස්තමේන්තුවක් යටතේ අබේපුස්ස යෝජිත පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ කටයුතු ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳව කිසිදු

තාක්ෂණික හැකියාවක් නොමැති පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට පළාත් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත පවරා තිබුණි. මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉදිකිරීමට අදාල සැලසුම්/ ඇස්තමේන්තු සැකසීම යන කාර්යයන් පෞද්ගලික වාස්තු විද්‍යාඥයෙකුට පවරා තිබූ අතර ප්‍රාරම්භක වියදම් හා උපදේශන ගාස්තු ලෙස රුපියල් මිලියන 60 ක් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් 2013 අගෝස්තු හා ඔක්තෝබර් මාසවලදී පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. අධිකාරිය විසින් එම මුදලින් රු.27,563,866 ක් වැයකර තිබූ නමුත් අදාල ඉදිකිරීම් ආරම්භ නොකර බිම සකස් කිරීම පමණක් සිදුකර වර්තමානයේ එම භූමියේ වගාවක් ආරම්භ කර තිබුණි.

(ඇ) පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට එකතු කළ අගය මත බදු (vat) ගෙවීමේදී කොන්ත්‍රාත් ඉන්වොයිසිවල සඳහන් එකතු කළ අගය මත බදු (vat) ලියාපදිංචි අංක හා කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කරවාගෙන නොතිබුණි. මේ හේතුවෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අක්‍රීය වැට් බදුහිමියන් ලෙස නම් කරන ලද කොන්ත්‍රාත්කරුවන් 25 දෙනෙකු සඳහා 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් රු.3,895,579 ක් හා රු.6,649,684 ක් වැට් බදු ලෙස ගෙවා තිබූ බව විගණනයේදී අනාවරණය විය.

(ඇ) පළාත් ක්‍රිඩා විද්‍යායතනයේ නව පරිශ්‍රය හා නව ක්‍රීඩා සංකීර්ණයක් බස්නාහිර පළාත තුළ ගොඩනැගීම සඳහා දැනට ක්‍රීඩා විද්‍යායතනයට අයත් අක්කර 04 ක භූමිය ප්‍රමාණවත් නොවන හෙයින් අවට ඇති බිම් කොටස් ප්‍රමාණයක් පවරා ගැනීමේ කටයුතු 2009 වර්ෂයේ සිට සම්පාදනය කර තිබුණි. එම කාර්යය සඳහා 2012 ජුනි මාසයේදී පළාත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර මහරගම ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රු.10,483,000 ක් තැන්පත් කර තිබුණි. ඉඩම් අත්පත් කර ගැනිමේ කටයුතුවලට පෙර භුක්තිය භාර ගැනීමේ කටයුතු සිදුකර තිබූ අතර එය 2014 අගෝස්තු 20 දිනැති අංක 1876 /32 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේද පල කර තිබුණි. මනා සැලසුමකින් හා නිසි අධ්‍යයනයකින් තොරව කටයුතු කිරීම නිසා දැනට තැන්පත් කර ඇති මුදලට වඩා විශාල මුදලක් ප්‍රාදේශීය ලේකම්වරයා වෙත තැන්පත් කිරීමට සිදුවීම, වන්දි ගෙවීම සඳහා විශාල මුදලක අවශ්‍යතාවය පැන නැගීම හා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ දැල්පන්දු හා අත්පන්දු ක්‍රීඩා පිටි ඉදිකිරීමට අවම වශයෙන් රු.මිලියන 150 ක් පමණ මුදලක් අවශ්‍යවීමත්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් නොවීමත් නිසා මෙම කටයුත්ත අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

**6.4 මතභේදයට තුඩුදෙන කරුණු**

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනත මඟින් පවරන ලද බලතලවලට හානියක් නොමැතිව නියෝග සැදිය යුතු අතර නියෝග සැදිය යුතු කාරණා 09 ක් මෙම පනතේ 18(2) වගන්තිය මඟින් පැහැදිලිව දක්වා තිබුණි. එහෙත් එම කාරණාවලට ඇතුළත් නොවන, මෙම පනතේ 3(5) වගන්තියට අනුව එක් එක් පළාතේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ ආදායම් එකතු කිරීමේ බලයට අනුකූල නොවන පරිදි 2007 මාර්තු 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ, පළාත් සභාවට ලැබිය යුතු ආදායම පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවට හිමිවන ලෙසින් සඳහන් කර තිබුණි. තවද ඉහත ගැසට් නිවේදනය අනුව 2014 වර්ෂය සඳහා පෞද්ගලික වෛද්‍ය ආයතන

ලියාපදිංචි කිරීමේ ගාස්තු ලෙස පළාත් සභාවට ලැබිය යුතු රු. 4,654,500 ක් අයකරගෙන නොතිබුණි.

(ආ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 29 දිනැති අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් එකතු කරනු ලබන මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු ආදායමෙන් සියයට 70 ක් පළාත් සභාවලට පැවරිය යුතු විය. සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් මෙලෙස එකතු කරගනු ලැබූ ආදායමෙන් සියයට 70 ක් ලෙස රු.781,592,645 ක් පළාත් සභාවට ලැබිය යුතු වුවද පිළිගතහැකි හේතුවක් නොදක්වා දිරි දීමනා ලෙස සියයට 1 ක් වශයෙන් රු.7,815,926 ක් මෝටර් රථ කොමසාරිස්වරයා විසින් රඳවාගෙන තිබුණි.

(ඇ) ආණ්ඩුකාරවරයාට වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් පැවරී ඇති කාර්යයන්වලට අදාළව ආණ්ඩුකාර ලේකම්වරයා විසින් ඉටුකළ යුතුව පවතින රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ආණ්ඩුකාර ලේකම්වරයාට 2010 ජූලි 01 දින සිට මාසිකව රු. 12,500 ක දීමනාවක් ගෙවා තිබුණි.

## 6.5 දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රු. 2,500,000 ක් වටිනා වාහනයක් 2013 ජනවාරි මාසයේදී අනතුරට ලක්වීම නිසා රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කරගත් රු.331,290 ක මුදල සමඟ අදාල වාහනය අළුත්වැඩියා කටයුතු සඳහා 2013 ජූලි මාසයේදී පෞද්ගලික ආයතනයකට ලබාදී තිබූ නමුත් අළුත්වැඩියා කටයුතු අවසන් කර වාහනය ආපසු ලබා ගැනීමට 2015 මැයි 11 දිනටත් කටයුතු කර නොතිබුණි. අළුත්වැඩියා ස්ථානය එම ස්ථානයෙන් ඉවත් කර ඇති බව 2015 මැයි 11 දින භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ අතර වාහනය ආපසු ලබාගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 6.6 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

කළුතර ප්‍රදේශීය වෛද්‍ය සැපයීම් අංශය තුළ ශීතකරණ 5 ක් හා අධිශීතකරණ 2 ක් වර්ෂ කිහිපයක සිට භාවිතයෙන් තොරව නිශ්ක්‍රීයව පැවතුණු අතර ගබඩාව සමඟ ඉදිකිරීම් නිමකර තිබූ මුරකුටි 2 ක හා රියදුරු විවේකාගාරය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

## 6.7 ආර්ථික නොවූ ගනුදෙනු

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සංවර්ධන ප්‍රදාන (PDG) යටතේ අඹේපුස්ස සංචාරක ගොවිපළ සංවර්ධනය හා පරිසර හිතකාමී නිවාස පෙළක් ඉදිකිරීම සඳහා 2012, 2013 හා 2014 වසරවල රු.14,475,114 ක් අනුමත කර 2014 වසර අවසාන වනවිට රු. 14,028,349 ක් වැයකර තිබුණි. එම මුදලින් දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා තනි කාමරයක් සහිත නවාතැන්පළත් (කබානා) හා සංචාරක නිවාස පෙළක් (කාමර තුනකින් යුතු මහල් ගොඩනැගිල්ලක්) ඉදිකර තිබූ නමුත් දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණය දිනාගත හැකි කිසිදු පරිසර සාධකයක් අඹේපුස්ස කෘෂි පුහුණු මධ්‍යස්ථානයේ හා ඒ අවට නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ "සුපසන් ගුරු අභිමානී" උපහාර උළෙල 2013 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර එම කාර්යය අවස්ථා තුනකදී කල්දමා තිබුණි. උළෙලේ විවිධ කටයුතු වෙනුවෙන් 2014 දෙසැම්බර් මාසය අවසානය වනවිට රු.950,510 ක වියදමක් දරා තිබුණි.

(ඇ) ඉංජිනේරු කාර්යාංශය විසින් 2006 දෙසැම්බර් මාසයේදී රු.1,230,000 කට මිලදීගෙන තිබූ හොඳ ධාවන තත්ත්වයෙන් යුත් මෝටර් රථයක් කිලෝමීටර 89,195 ක් ධාවනය කරවීමෙන් පසු වසර 10 කට වඩා පැරණි වාහන අපහරණය කිරීම යටතේ රු. 1,168,800 කට ටෙන්ඩර් මඟින් අපහරණය කර තිබුණි.

(ඈ) මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයට අයත් පාසලක නියෝජ්‍ය විදුහල්පතිනියක් කිසිදු රාජකාරි පැවරීමකින් තොරව 2014 ජනවාරි 23 දින සිට 2015 මාර්තු 09 දින දක්වා මිනුවන්ගොඩ ගුරු මධ්‍යස්ථානයට අනුයුක්ත කර තිබූ අතර අදාල කාලයට වැටුප් හා දීමනා වශයෙන් රු.466,116 ක් ගෙවා තිබුණි.

(ඉ) කළුතර ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලයට 2010 දෙසැම්බර් මාසයේදී මිලදීගෙන තිබූ රු.5,250,000 ක් වටිනා කැබ් රථයක් කිලෝ මීටර 500 ක් ධාවනයේ සිටම දෝෂ සහිත වී තිබූ බව වාර්තාවී තිබුණි. නිෂ්පාදන ආයතනය විසින් නිකුත්කළ වගකීම් සහතිකය අනුව වර්ෂ 04 ක් හෝ කිලෝ මීටර 150,000 යන අවස්ථා 02 න් පළමු එළඹෙන අවස්ථාව පරිදි විශේෂ නඩත්තු කාලයක් ලබාදී එම කාලය තුළ දරන ලද වියදම සම්බන්ධයෙන් එම ආයතනය වගකියන බව දක්වා තිබුණද, එම නඩත්තු කාලය තුළදී කල අළුත්වැඩියා වෙනුවෙන් රු.511,508 ක් ගෙවා තිබුණි.

**6.8 අධිකාරී බලයෙන් තොර ගනුදෙනු**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් පාලින්දනුවර ප්‍රාදේශීය සභාවට කාර්යාල උපකරණ ලබාදීම සඳහා රු. 2,498,070 ක් වැයකර තිබුණි. ප්‍රාදේශීය සභාව විසින් සිදුකළ මිලදී ගැනීමේදී 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති ප්‍රකාරව මිළ ගණන් නොකැඳවීම, අවශ්‍ය උපකරණවල පිරිවිතර හා ප්‍රමාණපත්‍ර සකස් නොකිරීම, පිරිවැය ඇස්තමේන්තුව නිසි පරිදි පිළියෙල නොකිරීම වැනි අඩුපාඩු නිරීක්ෂණය වූ අතර මිලදීගෙන තිබූ රැස්වීම් ශාලා පුටු 220 කින් පුටු 212 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) 2012 අයවැය යෝජනා ප්‍රකාරව 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා 2012 ජනවාරි සිට මාසිකව රු. 15,000 බැඟින් ගෙවීමට අනුමත වූ වෘත්තීය දීමනාව බස්නාහිර පළාත් සභාවටද අදාල කරගෙන තිබුණි. ඒ අනුව මෙම වෘත්තීය දීමනා වශයෙන් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් 23 දෙනෙකු සඳහා 2012 ජනවාරි සිට 2014 දෙසැම්බර් දක්වා රු. 11,340,000 ක් ගෙවා තිබූ නමුත් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ ඉංජිනේරුවරුන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

**6.9 හඳුනාගන්නා ලද පාඩු**

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) ගුණාත්මකභාවයෙන් තොරවීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කරන ලෙස වෛද්‍ය සැපයීම් අංශය විසින් දන්වා තිබූ රු. 1,984,032 ක් වටිනා වර්ග 36 කට අයත් ඖෂධ සහ එන්නත් විශාල ප්‍රමාණයක් වතුපිටිවල රෝහලේ ඖෂධ ගබඩාවේ තබාගෙන තිබුණි.

(ආ) බණ්ඩාරගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට අයත් අටුළුගම මාතෘ හා ළමා සායනයේ සිවිලිම නවීකරණ කටයුතු සඳහා කොන්ත්‍රාත්කරුවකුට රු. 322,186 ක මුදලක් ගෙවා තිබූ අතර එම සිවිලිම කඩාවැටීම හේතුවෙන් නැවත පිළිසකර කිරීම වෙනුවෙන් වෙනත් කොන්ත්‍රාත්කරුවකුට රු. 126,058 ක මුදලක් ගෙවා තිබුණි. පළමු කොන්ත්‍රාත්කරුගේ වැඩ පරීක්ෂා කිරීමකින් තොරව මුදල් ගෙවීම හේතුවෙන් නැවත රු.126,058 ක මුදලක් දැරීමට සිදුව තිබුණි.

(ඇ) කිරිබත්ගොඩ මූලික රෝහලේ වාට්ටුවල හා ගබඩාවේ රඳවාගෙන තිබූ වටිනාකම නිශ්චය කළ නොහැකි ඖෂධ වර්ග 51 කට අයත් ඖෂධ ඒකක 17,659 ක් කල්ඉකුත්වී තිබුණි.

## 6.10 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

-----------------------------------

පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් ගම්පහ දිස්ත්‍රික් විධායක ඉංජිනේරු කොට්ඨාශ 04 මඟින් රුපියල් බිලියන 05 ක් වටිනා මාර්ග සංවර්ධන ව්‍යාපෘති 158 ක්, පැකේජ ක්‍රමය යටතේ ව්‍යාපෘති 26 ක් ලෙස පෞද්ගලික කොන්ත්‍රාත් සමාගම් 03 කට ප්‍රදානය කර තිබුණි. මෙම එක් එක් පැකේජයන් පරීක්ෂාවේදී කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ලබාදී ඇති කාලසීමාව තුළ කිසිදු ව්‍යාපෘතියක් නිම කර නොතිබූ බවත් එම කොන්ත්‍රාත් මත අයකළ යුතු ප්‍රමාද ගාස්තු රු.365,946,701 ක් අය කිරීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය. තවද මෙම ව්‍යාපෘති සඳහා රු.768,712,195 ක් වැඩ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ නමුත් ඉන් රු.342,392,734 ක අත්තිකාරම් සඳහා අත්තිකාරම් බැඳුම්කර ලබාගෙන නොතිබුණි.

## 6.11 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහරගම විවිධසේවා සමූපකාර සමිතියට අයත් එගොඩවත්ත ග්‍රාමීය බැංකු ගොඩනැගිල්ලේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා මහරගම විවිධ සේවා සමූපකාර සමිතියට 2013 වර්ෂයේදී රු.1,000,000 ක් ගෙවා තිබුණි. 2013 ඔක්තෝබර් 01 දිනැති අංක FC/3/2/2014 දරන මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ චක්‍රලේඛය අනුව වාණිජ කාර්යන්වල යෙදී සිටින සමූපකාර සමිති සඳහා ඍජු ප්‍රදාන හෝ අනෙකුත් සම්පත් ලබා නොදිය යුතු වුවද එයට පටහැනිව මෙම සමිතියට ඍජු ප්‍රදාන ලබා දී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබියදී රු.500,000 බැගින් අවස්ථා දෙකකදී ගෙවීම් සිදුකර තිබූ අතර එක් චෙක්පතක් මාස 06 කින් පසු නැවත ආදායමට ගෙන තිබූ නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ආරම්භයේදී ගෙවූ රු. 500,000 ක මුදල ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වයං රැකියාවක් ලෙස මල් වගා කටයුතුවල නිරතවූවන්ට උපකරණ ලබාදීම සඳහා රු.7,482,295 ක් වැයකර එක් ප්‍රතිලාභියෙකුට රු.33,000 ක් වටිනා උපකරණ කට්ටලය බැගින් ප්‍රතිලාභීන් 220 කට උපකරණ කට්ටල ලබාදී තිබුණි. ගම්පහ

දිස්ත්‍රික්කයේ කෘෂි උපදේශක කාර්යාල 04 කට අයත් ප්‍රතිලාභීන් 11 දෙනෙකු සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී 2015 මැයි 15 දින වනවිටත් එම උපකරණ ප්‍රයෝජනයට ගනිමින් කිසිදු ප්‍රතිලාභියෙක් ස්වයං රැකියා ආරම්භ කර නොතිබූ බව අනාවරණය විය.

(ඇ) කිරිබත්ගොඩ මූලික රෝහලට හදිසි අනතුරු ඒකක ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු 2006 වර්ෂයේදී ආරම්භ කර තිබූ අතර, 2014 වර්ෂය අවසන් වනවිට එහි ඉදිකිරීම් සහ අනෙකුත් කටයුතු වෙනුවෙන් ව්‍යාපෘති 08 ක් යටතේ රු.37,259,645 ක මුදලක් වැයකර තිබුණි. 2015 වර්ෂයේ ජූලි මාසය වනවිටද අදාල කටයුතු නිම නොවීම හේතුවෙන් මහජනතාවට වැය කරන ලද මුදලින් ප්‍රතිලාභ ලබාගැනීම තවදුරටත් ප්‍රමාදවී තිබුණි.

## 6.12 කාර්යමණ්ඩල පරිපාලනය

### 6.12.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට පලාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**(අ) පලාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන**

| | අනුමත තත්‍ය සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/ තාවකාලික | |
| **ජ්‍යෙෂ්ඨ** | 2,804 | 2,598 | 17 | 206 |
| **තෘතීය** | 699 | 391 | 02 | 308 |
| **ද්විතීය** | 11,232 | 9,236 | 127 | 1,996 |
| **ප්‍රාථමික** | 5,102 | 5,035 | 23 | 67 |
| **කොන්ත්‍රාත්** | 13 | - | - | 13 |
| **තාවකාලික** | 14 | - | 14 | - |
| **එකතුව** | 19,864 | 17,260 | 183 | 2,590 |

## (ආ) පාසැල් කාර්ය මණ්ඩල

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විදුහල්පතිවරු | 1,732 | 1,226 | 506 | - |
| ගුරුභවතුන් | 34,374 | 34,897 | - | 523 |
| සුළු සේවක හා සහාය කාර්ය මණ්ඩලය | 3,681 | 3,334 | 347 | - |
| | 39,787 | 39,457 | 853 | 523 |

## (ඇ) පළාත් පාලන ආයතන

| | අනුමත තත්‍ය සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව ස්ථිර | තත්‍ය සේවක සංඛ්‍යාව අනියම්/ආදේශක/ කොන්ත්‍රාත්/ තාවකාලික | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 535 | 356 | 37 | 179 |
| ජ්‍යෙෂ්ඨ | | | | |
| තෘතීය | 345 | 161 | - | 184 |
| ද්විතීය | 6,102 | 4,536 | 131 | 1,566 |
| ප්‍රාථමික | 14,459 | 12,664 | 554 | 1,795 |
| කොන්ත්‍රාත් | 15 | - | 13 | 02 |
| තාවකාලික | 20 | - | 15 | 05 |
| එකතුව | 21,476 | 21,441 | 750 | 3,731 |

## (ඇ) ප්‍රඥප්ති මගින් පිහිටවූ ආයතන

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 77 | 47 | 30 | - |
| තෘතීය | 95 | 73 | 22 | - |
| ද්විතීය | 495 | 442 | 53 | - |
| ප්‍රාථමික | 643 | 620 | 23 | - |
| අනියම් / කොන්ත්‍රාත් | - | 54 | - | 54 |
| එකතුව | 1,310 | 1,236 | 128 | 54 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අධ්‍යාපන**

----------

(i) හෝමාගම කලාපයට අයත් කොට්ඨාශ තුනෙහි පාසැල්වල ප්‍රාථමික ගුරුවරු 261 ක් අතිරික්තව සිටි අතර බස්නාහිර පළාත තුළ පාසැල් 25 ක ප්‍රාථමික ගුරුවරු 151 ක ඌනතාවයක් පැවතුණි.

(ii) මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ පාසල්වල විදුහල්පති තනතුරු 62 ක හා නියෝජ්‍ය / සහකාර විදුහල්පති තනතුරු 116 ක පුරප්පාඩු පැවතුණි.

(iii) හොරණ කලාපයේ පාසල් සඳහා අනුයුක්ත කළයුතු පාසල් කාර්ය සහායක 11 දෙනෙකු කලාප කාර්යාලයේ සේවය සඳහා යොදාගෙන තිබුණි.

(iv) හොරණ කලාපයේ පාසල් 24 ක් සඳහා වැඩබලන විදුහල්පතිවරුන් ලෙස ශ්‍රී ලංකා ගුරු සේවයට අයත් ගුරුවරුන් පත්කර තිබුණි.

(v) මතුගම කලාපයට අයත් ජාතික පාසල් 02 ක සහ පළාත් සභා පාසල් 129 ක සමස්ථ ගුරු හිඟය 487 ක්වූ අතර මින් 1-5 දක්වා වූ ශ්‍රේණිවල ගුරු හිඟය 320 ක් විය.

(vi) මතුගම කලාපයට අයත් පාසල් 158 න් පාසල් 35 ක් සඳහා ශ්‍රී ලංකා ගරු සේවයේ ගුරුභවතුන් විදුහල්පති තනතුරේ රාජකාරි ආවරණය සඳහා පත්කර තිබුණි.

**(ආ) සෞඛ්‍ය**

---------

(i) වතුපිටිවල රෝහලේ රෝහල් කාර්ය මණ්ඩල හිඟතාවය මත රෝගී සත්කාරක සේවා නියමිත පරිදි සිදුනොවීම හේතුවෙන් 2012 හා 2013 වර්ෂවලදී සිදුවූ දරු උපත්වලදී උපතේදී හුස්ම හිරවීම හේතුවෙන් අසනීපවූ ළදරුවන් පිළිවෙලින් 22 ක් හා 10 ක්ද එම හේතුවෙන් මියගිය සංඛ්‍යාව 2 ක් හා 5 ක් ලෙසද වාර්තාවී තිබුණි.

(ii) මීරිගම මූලික රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලය හා තථ්‍ය කාර්ය මණ්ඩලයට අනුව, විශේෂඥ වෛද්‍ය නිලධාරීන් තිදෙනෙකු ළමා රෝග වෛද්‍ය නිලධාරී ඇතුළු වෛද්‍ය නිලධාරීන් 07 දෙනෙකු හා අනෙකුත් කාර්ය මණ්ඩල සමඟ පුරප්පාඩු 42 ක් පැවතීම තුළ සත්කාරක සේවා නියමිත පරිදි සිදුවී නොතිබුණි.

**(ඇ) වෙනත්**

-------

(i) පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ඉහළ කළමනාකරණ තනතුරු ඇතුළු විවිධ තනතුරුවල සේවය කර විශ්‍රාම ගිය නිලධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් ආණ්ඩුකාරවරයාගේ/පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ගෙන තිබු

අතර, ඉහළ ශ්‍රේණිවල පුරප්පාඩු තනතුරුවලට වැඩ බලන නිලධාරීන් පත් කිරීම දිගින් දිගටම සිදුව තිබුණි.

(ii) පළාත් සභාවේ ඇතැම් දෙපාර්තමේන්තු / ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුමත කාර්ය මණ්ඩලය තුළ ගණකාධිකාරී තනතුරක් නොමැති වුවද එම දෙපාර්තමේන්තු / ප්‍රාදේශීය කාර්යාල සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ පදනම මත වෙනත් කාර්යාලවල ගණකාධිකාරීවරුන් පත්කර දීමනා ගෙවා තිබුණි.

(iii) පළාත් පාලන ආයතන සැලකිය යුතු ප්‍රමාණයක ලේකම් තනතුරු පුරප්පාඩු වී තිබුණද එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු නොකර වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර තිබුණි.

**6.13 වාහන උපයෝජනය**

පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් ඩබල් කැබ් රථයක එංජිම, ක්ලචය හා අවලම්බන පද්ධතිය සියළු අංගෝපාංග අළුතින් යොදවා 2012 වසරේදී රු. 399,662 ක් වැයකර අළුත්වැඩියා කර තිබියදී කිලෝමීටර 59,412 ක් ධාවනයෙන් පසු 2014 වසරේදී නැවතත් එංජිම, ක්ලචය හා අවලම්බන පද්ධතියේ සියළු අංගෝපාංග අළුතින් යොදවා අළුත්වැඩියා කිරීමට රු.397,713 ක් වැයකරතිබුණි.මුල් අළුත්වැඩියාව නිසි පරිදි ඉටුනොවීම නිසා ඉතා ටික කාලයකින් නැවත සම්පූර්ණ අළුත්වැඩියාවක් කිරීමට සිදුවීමෙන් රු.397,713 ක පාඩුවක් සිදුව තිබුණි.

**6.14 බැංකු ගිණුම්**

බැංකු ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතන 05 ක බැංකු ජංගම ගිණුම් 05 ක මාස 06 ඉක්මවූ උපලබ්ධි නොවූ තැන්පතු වල වටිනාකම රු. 21,685,191 ක් විය.

(ආ) ආයතන 06 ක බැංකු ජංගම ගිණුම් 11 කට අදාලව ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ එකතුව රු.2,624,961 ක් වූ චෙක්පත් 135 ක් සම්බන්ධයෙන් මු.රෙ. 396 විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන 05 ක බැංකු ජංගම ගිණුම් 09 කට අදාලව හඳුනානොගත් හර රු. 3,750 ක් හා හඳුනානොගත් බැර රු. 2,909,556 ක් විය.

**6.15 පළාත් පාලන බල මණ්ඩල කටයුතු අධීක්ෂණය**

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උපලේඛනයේ 4.2 වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන ආයතනයන්ගේ අධීක්ෂණය පළාත් සභාව වෙත පැවරී තිබුණද, පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණ අතර, ගිණුම් විගණනයේදී අනාවරණය වී ඇති කරුණු පළාත් පාලන බල මණ්ඩල

ප්‍රධානීන්ගේ අවධානයට යොමු කර තිබුණි. තවද, පළාත් පාලන බල මණ්ඩල ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයා විසින් විගණන මතය ව්‍යාවනය (Disclaimer Opinion) කර ඇති හා අහිතකර මතයක් (Adverse Opinion) ප්‍රකාශ කර ඇති අවස්ථා පිළිබඳ සමාලෝචිත වර්ෂය ඇතුළුව ආසන්න වසර 04ක තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | විගණනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | විගණන මතය ව්‍යාවනය කළ පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව | අහිතකර මතයක් ප්‍රකාශකල පළාත් පාලන බල මණ්ඩල (මූල්‍ය ප්‍රකාශන) සංඛ්‍යාව |
|---|---|---|---|
| 2010 | 48 | 13 | - |
| 2011 | 48 | 20 | - |
| 2012 | 48 | 26 | - |
| 2013 | 48 | 04 | 25 |
| 2014 | 47 | 05 | 04 |

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව පළාත් පාලන බල මණ්ඩල 47 (කොළඹ මහා නගර සභාව හැර) ක හිඟ ආදායම රු. 3,112,176,951 ක් විය.

(ඇ) පළාත් පාලන බල මණ්ඩල 12 ක නිලධාරීන්ට / වෙනත් අයවලුන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් පනවන ලද අධිභාර අනුව 2014 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර වල අගය රු. 31,066,379 ක් විය.

(ඈ) පළාත් පාලන බල මණ්ඩල වල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ඉ) පළාත් පාලන බලමණ්ඩලවල පවත්නා අඩුපාඩු පිළිබඳව 2015 ජුනි 30 දක්වා නිකුත් කර තිබූ විගණන විමසුම්වලින්, විමසුම් 285 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අර්ධ වාර්ෂිකව සිදුකළ යුතු කාර්යාල පරීක්ෂාවන් පිළිබඳ විමර්ශන නිලධාරී වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබූ බැවින් කාර්යාල පරීක්ෂණ යාවත්කාලීනව සිදුකර තිබුණේද යන්න පරීක්ෂා කළ නොහැකි විය.

## 7. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 7.1 අභ්‍යන්තර විගණන

පළාත් සභාවේ අභ්‍යන්තර විගණන වැඩසටහන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**7.2 විගණන හා කළමනාකරණ කමිටු**

පළාත් සභාවේ ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල විගණන හා කළමනාකරණ කමිටුවල ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතුනි.

**7.3 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලසුම් සකස් කළයුතු පළාත්සභා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 06 ක ප්‍රසම්පාදන සැලසුම් සකස් කර නොතිබුණි.

**7.4 විගණකාධිපතිවරයාගේ වාර්තා සභාගත කිරීම.**

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තියේ විධිවිධාන පරිදි පසුගිය වර්ෂයන්හි බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කල දිනය | සභාගත කල දිනය |
|---|---|---|
| 2009 | 2010.10.26 | 2013.01.08 |
| 2010 | 2012.01.16 | 2012.05.22 |
| 2011 | 2013.02.28 | 2013.12.03 |
| 2012 | 2014.08.27 | සභාගත කර නැත |
| 2013 | 2014.12.31 | සභාගත කර නැත |

**7.5 නොවිසඳී ඇති විගණන ඡේද**

(අ) රු. 68,597,020 ක පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මඟින් ඉදිකර තිබූ හෝමාගම බස්නැවතුම්පළ මහජන පරිහරණය සඳහා 2012 නොවැම්බර් 21 දින විවෘත කර 2012 දෙසැම්බර් 10 දින බස් රථ ධාවන කටයුතු ආරම්භ කර තිබුනද සතියක් ගතවීමටත් පෙර බස්නැවතුම්පළ ගිලාබැසීම නිසා බස් රථ ඇතුළුකිරීමට නොහැකිව තිබුණි. මෙම තත්ත්වය 2012 වර්ෂයට අදාල මාගේ වාර්තාවෙන්ද පෙන්වා දී තිබූ නමුත් මෙම බස්නැවතුම්පළ 2015 ජූලි 15 දිනටත් යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

(ආ) ප්‍රධාන ලේකම් කාර්යාලය ප්‍රසම්පාදන පටිපාටිය අනුගමනය නොකර කුලී ගිවිසුමකින්ද තොරව කුලී පදනම මත වාහනයක් ලබාගෙන 2009 ජුනි සිට මසකට රු. 40,000 ක් බැගින් කුලී ගෙවා තිබූ අතර එම වාහනය කාර්යාල පරිශ්‍රය තුළට පැමිණිබව තහවුරු කරගත හැකි සාක්ෂි කිසිවක් ඉදිරිපත් නොකෙරුණි. මෙම තත්ත්වය 2012 වර්ෂයට අදාල මාගේ වාර්තාවෙන්ද පෙන්වාදී තිබූ නමුත් මේ දක්වා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පළාත් සභාව ආරම්භයේ සිට වාර්ෂික මුදල් ප්‍රකාශය මඟින් ප්‍රධාන අමාත්‍යවරයාට පැවරී තිබූ මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, පළාත් පරිපාලන හා ආර්ථික සංවර්ධනය යන විෂයයන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියෙන් 2009 මැයි මාසයේදී ප්‍රධාන ලේකම්වරයාට පවරා තිබුණි. මෙහිදී ප්‍රධාන අමාත්‍ය ලේකම්වරයාගේ විෂය පථයට ඇතුළත්ව තිබූ අමාත්‍ය මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකා නිකුත් කිරීම ප්‍රධාන ලේකම්ට පැවරී තිබූ අතර, ප්‍රධාන ලේකම්වරයා, පළාත් භාණ්ඩාගාරයේ ලේකම් වශයෙන් පළාත් ගිණුම්කාරක සභාව නියෝජනය කරන බැවින් අමාත්‍ය මණ්ඩල රැස්වීම් මෙහෙයවීම හා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවලට අත්සන් තැබීම සුදුසු කටයුත්තක් නොවීය. මෙම තත්ත්වය සුදුසු නොවන බව ආණ්ඩුකාර ලේකම්වරයාද පිළිගෙන තිබූ අතර මේ පිළිබඳව 2011 වර්ෂයට අදාල මාගේ වාර්තාවෙන්ද පෙන්වාදී තිබූ නමුත් මේ දක්වා නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 7.6 පාරිසරික හා සමාජමය වගකීම් ඉටුකිරීම

මීරිගම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල බල ප්‍රදේශය තුළ පරිසරයට හා ප්‍රජා සෞඛ්‍යයට අහිතකර මෙන්ම අනතුරුදායක හා අප්‍රියජනක කර්මාන්ත 94 ක් ස්ථානගත කර තිබූ අතර, බල ප්‍රදේශය තුළ තිබෙන නිවාස 973 ක කිසිම වැසිකිළියක් නොතිබීම සහ තවත් නිවාස 448 ක සනීපාරක්ෂක නොවන තත්ත්වයේ වැසිකිළි පැවතීම අනාවරණය කරගෙන තිබුණද, සුදුසු විසඳුම් ලබාදීම මන්දගාමී තත්ත්වයකින් සිදුව තිබුණි. තවද බල ප්‍රදේශයේ ඉදිකර තිබෙන අනාරක්ෂිත නිවාස 5,330 ක් සම්බන්ධයෙන් වන ගැටළුවද විසඳුමකින් තොරව පැවතුණි.

## 8. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය
(ඇ) පළාත් සභා සංවර්ධන සැලැස්ම
(ඈ) පළාත් පාලන බල මණ්ඩල අධීක්ෂණය
(ඉ) සේවක මණ්ඩල